දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය

Distance and Continuing Education Unit – University of Ruhuna

ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) 2016 පරීක්ෂණය (2014 පුනර්) - 2017 පෙබරවාරි/මාර්තු

First Examination in Arts (External) 2016 (Repeat 2014) – February/March 2017

# සිංප්‍ර 1.2 - සාහිත්‍ය පරිචය

# SL 1.2 – Competence of Literature

කාලය පැය තුන යි

**පළමු වන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

**නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු විය හැකි ය**

---

01. (අ) පහත සඳහන් ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත පද සියල්ලෙහි තේරුම් සහිත ව එම ඡේදය වත්මන් ලිඛිත සිංහලය ට නඟන්න.

"ඒ කුමාරයා දවස මුළුල්ලෙහි කොල්ලන් හා එක් වැ **කෙළ පියා** සවස ගෙට **වදනට** නොපොහොසත් වූයේ නෑයන්ගේ ගෙට යන්නේ ය. මැණියෝ ද 'දරුවෝ දූන් එත් දො හෝ, දූන් එත් දෝ හෝ" යි පෙර මඟ බල - බලා හිඳ සවස් වන තුරු නො එන්නා දැක, "මා **දරණු හෙයින්** ගෙට එන්නට භය ඇති වැ නො එති' යි සිතා **ශෝකයෙන් පුරා ගෙන** කඳුළු පිරුණු මුහුණින් යුක්ත වැ නෑයන්ගේ ගෙවල්හි බලන්නාහු, පුතණුවන් දැක වඩා ගෙන සිප සනසා පියා දැතින් තර කොට, අල්ලා ගෙන "පුත, මා කී බසුත් සිතැ තබද්ද"යි ආදි ඇති ප්‍රේමයටත් වඩා ප්‍රේම උපදවන්නාහ. මෙ සේ දේවයෙනි, දරුවෝ මැණියන්ට කිසි කලෙකත් **වඩා ලා ම** ප්‍රිය වන්නාහ" යි වදාරා දෙ වන පැනය විසඳා වදාළ සේක. දේවතා දූ පෙර පරිද්දෙන් ම සාධුකාර දී පූජා කළා ය.

උම්මග්ග ජාතකය (සංස්) සුචරිත ගම්ලත්

(ලකුණු 07)

(ආ) පහත සඳහන් පද්‍ය පන්තියේ තද කළු අකුරින් මුද්‍රිත පද සියල්ලෙහි සරල තේරුම සහිත ව එම පද්‍ය පන්තිය වත්මන් ලිඛිත සිංහලයට නඟන්න.

**වියත** උදුළ **කිරණැවි** රළ පැහැ **පැහැස**
දිගත විසුළ සුර ගඟුලැලි දිසි විලස
දියත **පතළ** පිරිසිඳු සඳ රැස් **වෙසෙස**
තනෙත පුරා දකු දූහැ ගතෙහි සරතස

(ලකුණු 07)

(ඇ) පහත දැක්වෙන උද්ධෘතයෙහි තද කළු අකුරින් මුද්‍රිත වචන සියල්ලෙහි අර්ථ ඇතුලත් වන පරිදි එය වත්මන් ව්‍යවහාර සිංහලයට නඟන්න.

**රන් රසේ සෙ** එ දෙදෙනා එක් වී සිතැඟි ලෙ දා
**වෙන් ලෙසේ සිරිකතා** කුමරු රැගෙන එ ළ දා
**නන් දෙසේ** නරඹමින වනයෙ විසිතුරු සො දා
**මන් තොසේ** බරණැස මගට පිළිපන් මෙ දා

(ලකුණු 07)

(ඇ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි තේමාව, උපයුක්ත භාෂාව සහ ඖචිත්‍යය යන අංගත්‍රය කෙරෙහි අවධානය යොමු කරමින් විචාරයක් සපයන්න.

පෙර පෙර කඳුළු කිරි දරුවෙකු අතේ දරා
පෙර ලා නොගොස් පෙම්බර මව් පියන් කරා
ද ර දඬු ගැහුණ අතපය හාමතේ දිරා
න ර කාදියක හිමියනි අද යසෝ දරා

කු ම රකු සමග තෙමි තෙමි කඳුලැලි වැස්සේ
බි ම පෙරළෙමින් ඉකි බිඳ ඇඬුවට පස්සේ
ම ම හිමි සඳුනි ගිය අවුරුදු හය තිස්සේ
මෙම පඩි පෙළෙන් නැහැ තව එළියට බැස්සේ

පෙම බර බිසව සහ පුතනු ද රුවින් හෙබී
අ ම තක කෙරුව හැටියට බුදු බවක් ලැබී
ම ම හිමියනේ ඇඬුවා මිස කඳුළු බිබී
මෙම කවුළුවෙන් වට පිට නො බැලුවෙමි එබී

ද ශ ගෙයි විඳින දුක රජ මැඳුරෙහි වින්දේ
ඉ ශ වට මෙතෙක් මා දළ රෙදි ම ය ඇන්දේ
ළ ශ නැති හිමිගෙ ගුණ සිහි කර අඩ නින්දේ
අ ශ නක් කවුද මේ තරමට ඉකි බින්දේ

ඉකිබිඳ අඬන වැලපෙන පති දහම රැක
දෙනවද අනේ අඟනක හට මෙහෙම දුක
නැණමද පබාවතියගෙ පෙර සිරිත දැක
කෙරුවද අනේ හිමියනි ඔබ එකට එක

(ලකුණු 07)

02. පාලකයන් හා ඔවුන්ගේ උපදේශකයන් හාස්‍යයට ලක් කිරීමෙහි ලා **උමංදාව** කතුවරයා දක්වන දක්ෂතාව සනිදර්ශනව විමර්ශනය කරන්න.

03. **ප්‍රේමයේ සත්‍ය කතාවක්** නවකතාවෙහි වෛද්‍ය වීරසිංහ, ඉන්දිරා, නිමල්, උපාලි යන චරිත තද් කතාවේ මුඛ්‍යාර්ථය උද්දීපනය කිරීමට සම්බන්ධ වන අයුරු විමර්ශනාත්මක ව පැහැදිලි කරන්න.

04. **මනමේ** නාට්‍යයේ සහ ඊට ආශ්‍රිත ජාතක කථාවේ පවත්නා සමාන අසමානතා තුනක් අවස්ථා හෝ චරිත හෝ ඇසුරෙන් පැහැදිලි කරන්න.

05. **යසෝදරාවතේ** රචනා රීතියෙහි දැකිය හැකි විශේෂතා තුනක් පෙන්වා දෙමින් ඒවා කාව්‍ය නිර්මාණයේ සාර්ථකත්වයට හෝ අසාර්ථකත්වයට හෝ හේතු වී ඇති අයුරු පහදන්න

06. **ගිරා සන්දේශ** කතුවරයාගේ පරිකල්පන ශක්‍යතාව අදාළ නිදසුන් ඇසුරෙන් පෙන්වා දෙන්න.

(02 සිට 06 දක්වා ප්‍රශ්නවලට ලකුණු 18 බැගිනි)

*******************************************